# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1653/14 – 2010 මැයි 12 වැනි බදාදා – 2010.05.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: මහ/3/316/අත්.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ
යොමු අංකය: එල්ඩී/05/2008/යූඩීජ්/05.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

*පිඹුර*: පී. පී. කො. 9104

කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙපානම ගමේ පිහිටි මිල්ලගහදෙනිය/නුගගහලන්ද/ජින්ජර්හේන නමැති ඉඩම.

**කැබලි අංක 01**
ඉඩමේ නම: මිල්ලගහදෙනිය/නුගගහලන්ද/ජින්ජර්හේන; විස්තරය: රබර් වගාව; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එල්. ඩී. එස්. සමරසිංහ, අංක 121, දෙපානම, පන්නිපිටිය; ප්‍රමාණය: හෙක්. 3.2047.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2010 ජූනි මස 03 වැනි දින පෙ.ව. 09.00 ට මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2010 මැයි මස 26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි පරීක්ෂණයේ දී මා වෙත ඉදිරිපත් කළ යුතුය.

චන්ද්‍රරත්න පල්ලේගම,
ප්‍රාදේශීය ලේකම්,
මහරගම.

2010 මැයි මස 12 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මහරගම.

05 - 679

1A – G 12843 – 345 (2010/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.